# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## රැකියා පුරප්පාඩු

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **මෙම තනතුරු සඳහා බඳවාගැනීම් කොළඹ ප්‍රධාන කාර්යාලය සඳහා පමණක් සිදු කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

| අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|
| 01 | නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස් (සුපරීක්ෂණ සහ ඇගයීම) MM -1-3 | 02 | <u>**සුදුසුකම් සහ පළපුරුද්ද**</u><br><br><u>**බාහිර අයදුම්කරුවන්:**</u><br>I. ආර්ථික විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, සංවර්ධන අධ්‍යයනය, දත්ත විද්‍යාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්<br>සහ<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්ද.<br><br><u>**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**</u><br><br>**1.** බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම<br>**හෝ**<br>**2.** තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව කළමනාකාර බණ්ඩයේ (MM1-1) තනතුරක අවම වශයෙන් වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>**වැටුප් පරිමාණය:-** 96,650 - 10 x 2,480 - 15 x 3,450 – 173,200 (MM 1-3)<br>**මූලික වැටුප් පියවර:- රු.85,896/-** (අංක 2025/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව)<br><br>(අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම්) |
| 02 | සහකාර සුබසාධක කොමසාරිස් (සංවර්ධන හා පර්යේෂණ)<br><br>MM -1-1 | 01 | <u>**සුදුසුකම් සහ පළපුරුද්ද**</u><br><br><u>**බාහිර අයදුම්කරුවන්**</u><br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආර්ථික විද්‍යා / සංඛ්‍යාලේඛන / මූල්‍ය / රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර පරිපාලන හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම උපාධියක්.<br>සමඟ |

| | | | |
|---|---|---|---|
| | | | පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම.<br><br>**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්:</u>**<br><br>**1.** බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම<br><br>**වැටුප් පරිමාණය:-** . 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240 (MM 1-1)<br>**මූලික වැටුප් පියවර:-** රු.81,710/- (අංක 2025/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව)<br><br>(අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම්) |

**වයස් සීමාවන්:**

**<u>නියෝජ්‍ය සුබසාධක කොමසාරිස්, සහකාර සුබසාධක කොමසාරිස්</u>**

වයස අවුරුදු 22 ට නො අඩු සහ අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**සාමාන්‍ය කොන්දේසි:**

- වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් රජයේ දායකත්වය ලෙස 12% ක් ගෙවනු ලැබේ. තව ද, සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක දායකත්වයක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.
- පත්වීම් සිදු කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව ය.
- මෙම තනතුරු ස්ථිර වේ. තනතුරුවල ස්ථිර කිරීමට පෙර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

**මාසික වේතනය:**

අංක 2025/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව-

- MM 1-3 - 2025 රු. [96,650 - 10 x 2,480 - 15 x 3,450 – 173,200] + රජය විසින් අනුමත දීමනා
- MM 1-1-2025 රු. [91,690 – 10 x 2,480 - 15 x 3,450 – 168,240] + රජය විසින් අනුමත දීමනා

වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් රජයේ දායකත්වය ලෙස 12% ක් ගෙවනු ලැබේ. තව ද, සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක දායකත්වයක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

අයදුම්පත පහත සඳහන් වෙබ් අඩවිවලින් බාගත කරගත හැක:

- https://www.wbb.gov.lk/web/si/jobs

  **හෝ**
- https://www.treasury.gov.lk >> [Vacancies] (To open directly, SCAN the QR)

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**For Online Application Preparation Documentation**

- https://wbbmis.online/document

| SCAN - QR | SCAN - QR | Online Documentation |
|---|---|---|
| WBB –Vacancy | Ministry of Finance | WBBMIS - Document Portal<br>https://wbbmis.online/document |

- අයදුම්පත ඇතුළත් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, එය **2026.10.26....** **දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය, අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07."** යන ලිපිනයට යොමු කළ යුතු ය.
- රාජ්‍ය / සංස්ථා අංශයේ ආයතනවල අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ අවසාන දිනයට පසු ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම් කරන්නේ නම්, **එක් එක් තනතුර සඳහා සහතික පත්‍රවල පිටපත් සමඟ වෙන වෙන ම කවරවල බහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.**
- මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම (shortlisting) සම්බන්ධ සියලු ම හිමිකම් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා සතු වේ.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED